**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**--------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

-----------------------

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නියමිත දිනයට පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන හා සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** | | |
| | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්,එය මාස 02 ක ප්‍රමාදයකින් පසු එනම් 2019 අප්‍රේල් 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව නිකුත් කරනු ලබන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 වර්ෂය වෙනුවෙන් නව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සැකසීමේදී මතු වූ ගැටළු හේතුවෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු සහාය පැතීමට සිදුවීම. |
| (ආ) | **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය** | | |
| | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් | 2018 වර්ෂය වෙනුවෙන් නව මූල්‍ය ප්‍රකාශන කට්ටලය |

| | | |
|---|---|---|
| දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විෂය අංක 26011 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය දින 06 ක ප්‍රමාදයකින් පසුව එනම් 2019 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | සැකසීමේදී මතු වූ ගැටළු හේතුවෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු සහාය පැතීමට සිදුවීම. |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

**2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය තුළ අපහරණය කරන ලද පිරිවැය හඳුනාගත නොහැකි ජංගම නොවන වත්කම් අයිතම 257ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ගිණුම්වලින් අපහරණය කර නොතිබුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | 2018 වර්ෂයේදී අපහරණය කරන ලද වත්කම් ගිණුම්ගත කර නොතිබූ බැවින් ගිණුමේ අපහරණ කිරීම් යටතේ දක්වා නොමැත. |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පුනරාවර්තන ගෙවීම් ලෙස රු.971,886,868 ක් දක්වා තිබුණද නිවැරදි ශේෂය රු.964,871,360 ක් වූයෙන් රු.7,015,508 ක වෙනසක් පැවතුණි. | නිවැරදි අගය ගිණුමේ දැක්විය යුතුය. | පිළිගනිමි. |

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | -------------- | --------------------------------- |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ ලැබීම් හා ගෙවීම් සඳහා 260011 සහ 260012 අගයන් ඒකාබද්ධ කර දැක්විය යුතු වුවද, 260011 අගයන් පමණක් සැලකිල්ලට ගෙන ගිණුම් පිළියෙල කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කර ගනිමි. |

(ඇ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | --------------------------------- |
| **(i)** | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කිසිදු වත්කමක් මූල්‍ය නොවන වත්කම් තුළට ඇතුළත් කර නොතිබුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | 2018 වර්ෂයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දත්ත ඇතුළත් කළද තුලනය නොවීම නිසා එම දත්ත ඉවත් කිරීම් කළ අතර 2019 වර්ෂයේදී දත්ත ඇතුළත් කිරීම් ආරම්භ කර ඇත. |
| **(ii)** | ප්‍රධාන තක්සේරුකරුගේ 2017 නොවැම්බර් 08 දිනැති අංක CL/SA/DS/NE/01 දරන ලිපියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටි ගොඩනැගිලි පරිශ්‍රය රු.633,250,000 ක වටිනාකමට තක්සේරු කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.1,167,388 ක් ලෙස රු.632,082,612 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කර නොමැත. ඇතුළත් කළ වටිනාකම ගිණුමෙන් ඉවත්වී ඇති බැවින් 2019 අප්‍රේල් මාසයේදී නැවත ඇතුළත් කරන ලදී. |
| **(iii)** | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.1,072,887,249 ක් ලෙස දැක්වුවද, භාණ්ඩාගාරයේ ගිණුම්ගත කර තිබූ අගය රු.1,150,387,393 ක් | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | ඒ සී ඒ 6 ආකෘතියේ තීරු වශයෙන් එකතුව සටහන් වීමේ දෝෂයක් නිසා භාණ්ඩාගාරයේ අගය හා වෙනස් වී ඇත. |

| | | | |
|---|---|---|---|
| | වූයෙන් රු.77,500,144 ක නොසැසඳීමක් පැවතුණි. | | |
| **(iv)** | භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව රු.79,150,000 ක් වූ ඉඩම්වල වටිනාකම එම අගය ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවට සටහන් කර නොතිබුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් යටතේ රු. 54,750,000ක් ඇතුළත් කර තිබුණද තක්සේරු දෙපාර්තමේන්තු වාර්තාව ලැබී නොමැති බැවින් ගිණුමට ඇතුළත් නොකරන ලදී. |
| **(v)** | ඒ සී ඒ 6 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ නිවාස නොවන ගොඩනැඟිලිවල වටිනාකම රු.157,818,570 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ එම අගය රු.155,852,339 ක් වූයෙන් රු.1,966,231 ක නොසැසඳීමක් පැවතුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | ඒ සී ඒ 6 ආකෘතියේ තීරු වශයෙන් එකතුව සටහන් වීමේ දෝෂයක් නිසා භාණ්ඩාගාරයේ අගය හා වෙනස් වී ඇත. |
| **(vi)** | 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ ප්‍රවාහන උපකරණ වත්කම් යටතේ ගිණුම්ගත කර තිබූ වටිනාකම රු.78,904,834 ක් වුවද, ජංගම නොවන වත්කම් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශනයේ එම අගය රු.78,774,550 ක් වූයෙන් රු.130,284 ක නොසැසඳීමක් පැවතුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | භාණ්ඩාගාරයේද දැක්වෙන්නේ වර්ෂයේ ආරම්භක ශේෂය රු.78,774,550 ක් වන බැවින් වෙනසක් නොමැත. |
| **(vii)** | වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ භාණ්ඩාගාරයේ ගිණුම්ගත කර තිබූ වටිනාකම රු.92,799,626 ක් වුවද, ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ එම අගය රු.178,845,643 ක් වූයෙන් රු.86,046,017 ක නොසැසඳීමක් පැවතුණි. | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | ඒ සී ඒ 6 ආකෘතියේ තීරු වශයෙන් එකතුව සටහන් වීමේ දෝෂයක් නිසා භාණ්ඩාගාරයේ අගය හා වෙනස් වී ඇත. |
| **(viii)** | කෙරීගෙන යන වැඩ ලෙස භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ රු.28,944,283 | ගිණුමේ නිවැරදි අගයන් දැක්විය යුතුය. | 2019 වර්ෂයේදී නැවත ඇතුළත් කරන ලදී. |

ක අගයක් දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ ජංගම නොවන සංචලන විස්තරාත්මක වාර්තාවේ කෙරීගෙන යන වැඩ ලෙස අගයක් දක්වා නොතිබුණි.

(ඇ) වෙනත්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගෙවීම් හා පොදු තැන්පත් ගිණුමේ ගෙවීම් වෙන් වෙන්ව නොපෙන්වා ප්‍රධාන ලෙජර වියදම් ලෙසද එම ගිණුම්වලට අදාළ ලැබීම් ආදායම් නොවන ලැබීම් ලෙසද සටහන් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නැවත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ගනිමි. |

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | <u>බඩු ලේඛන පොත</u><br>මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව ග්‍රාම නිලධාරී කාර්යාල 11 ක බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොතක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වමි. |
| (ii) | <u>පවුල් තොරතුරු ඇතුළත් ලේඛනය</u><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ග්‍රාම නිලධාරි වසම් 20 ක ග්‍රාම නිලධාරීන් විසින් තම | ග්‍රාම නිලධාරී අත්පොත අනුව පවුල් තොරතුරු ලේඛනයක් සකස් කළ යුතුය. | ඉදිරියේදී නිවැරදි කර ගන්නා බව දන්වමි. |

වසමේ ජීවත්වන පුද්ගලයන් පිළිබඳ පවුල් තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ඊ) විගණන සාක්ෂි නොවීම**

**----------------------------**

**පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.**

| නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් මගින් ඉටු කළ, එකතුව රු.6,081,640 ක් වූ කර්මාන්ත 05 ක බිල්පත්වල මිනුම් නිවැරදිව සටහන් නොකිරීම නිසා කර්මාන්තය භෞතිකව පරීක්ෂා කර මිනුම්වල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | භෞතිකව පවතින මිනුම් බිල්පතේ ලිවිය යුතුය. | බිල්පත් ලිවිමේදී මිනුම් භෞතිකව පරීක්ෂා කළ හැකි වන පරිදි බිල්පත් ලිවීමට උපදෙස් ලබාදී ඇත. |

**(උ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

**----------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය හා දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටුවල මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |

නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| **(ii)** | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතායට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලා ගතයුතු වුවත්, වාර්තාවේ1.6.1.(අ),(ආ) ඡේදවල සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ වාර්තාව නියමිත දිනට සකස් කර ඉදිරිපත් කළද වාර්තාව සකස් කිරීමේදී පැවති ගැටළු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කරන ලද වාර්තාවක් නැවත විගණනයට ලබා දී ඇත. |

**(ඌ)** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| **(I)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | | |
| | II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක මූලික විමර්ශන 86 ක කටයුතු ආරම්භ කර දින 73 සිට දින 1460 දක්වා කාල පරාසයක් ගත වී තිබුණද, විගණිත දිනය වන 2019 පෙබරවාරි 09 දින වන විටත් විමර්ශන කටයුතු නිමකර නොතිබුණි. | නොපමාව විමර්ශන කටයුතු නිම කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 05ක්, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 04ක්, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 01ක් වශයෙන් විමර්ශන වාර්තා මේ වනවිට ලැබී ඇති අතර එම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | සඳහා අදාළ අංශ දැනුවත් කර ඇත. |
| **(II)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** ------------------ | | | | |
| **(i)** | මුදල් රෙගුලාසි 138(4)(6)(8) | 1,950,177 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක අසම්පූර්ණ තොරතුරු සහිත වවුචර සඳහා අවස්ථා 21 කදී රු.1,950,177 ක මුදලක් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | භාණ්ඩ ලැබීමේ ප්‍රමාදය නිසා චෙක්පත් ලියා රඳවාගෙන තබා ගෙන ඇත. මේ වන විට වවුචර්වල පැවති සියලු අඩුපාඩු සම්පූර්ණ කරගෙන ඇත. |
| **(ii)** | මුදල් රෙගුලාසි 237 | 4,758,242 | 2018 දෙසැම්බර් 31 දින වන විට රු.4,758,242ක් වටිනා භාණ්ඩ සඳහා චෙක්පත් 32 ක් ලියා විගණිත දිනය වූ 2019 ජනවාරි 31 දින වන විටත් අත රඳවාගෙන තිබූ අතර, අදාළ භාණ්ඩ කාර්යාලය වෙත ලැබී නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | භාණ්ඩ ලැබීමේ ප්‍රමාදය නිසා චෙක්පත් ලියා රඳවා තබා ගෙන ඇත. මේ වන විට වවුචර්වල පැවති සියලු අඩුපාඩු සම්පූර්ණ කරගෙන ඇත. සියලුම භාණ්ඩද කාර්යාල වෙත ලැබී ඇත. |
| **(III)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ** ------------------ | | | | |
| **(i)** | 2014 ඔක්තෝබර් 23 දිනැති අංක HAF-3-PAYMT-04-02 දරන චක්‍රලේඛය | | ග්‍රාම නිලධාරීන්/නිලධාරිනියන් වසමේ පිහිටි කාර්යාලය තුළදී මෙන්ම, ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවලදීද නිල ඇඳුමින් සැරසී නිල ලාංඡනය පැළඳ රාජකාරි දිනපොත රැගෙන යාම අනිවාර්යය වුවත්, පරීක්ෂණ අවස්ථාවේ | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | රාජකාරී කටයුතු ඉදිරියේදී එසේ සිදු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරන බවට දැනුවත් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ග්‍රාම නිලධාරී වසම් 36ක ග්‍රාම නිලධාරීන් නිල ඇඳුමින් සැරසී නොසිටීමත් ග්‍රාම නිලධාරීන් 40 දෙනෙකු නිල ලාංඡනය පැළඳ නොසිටීමත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ග්‍රාම නිලධාරීන්/ග්‍රාම නිලධාරිනියන් 21 දෙනෙකු දින පොත යාවත්කාලීනව පවත්වා නොතිබීමත් නිරීක්ෂණය විය. | | |
| **(ii)** | 2016 අප්‍රේල් 27 දිනැති අංක HAF-3-ADMIN-04-002 දරන චක්‍රලේඛයේ 03(i) ඡේදය | | සඳුදා, බ්‍රහස්පතින්දා මුළු දිනයම හා සෙනසුරාදා ප.ව.12.30 වන තුරු තම කාර්යාලවල අනිවාර්යයෙන්ම රැඳී සිටිය යුතු වුවත් පරීක්ෂා කරන අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ග්‍රාම නිලධාරී කාර්යාල 13 ක් වසා තිබූ අතර, ඔවුන් නිවාඩු බවට හෝ වෙනත් කාර්යයක නිරත වන බවට දැන්වීම් පුවරුවේ දැන්වීමක් ප්‍රදර්ශනය කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී එසේ සිදු නොකරන නිලධාරීන් හට විනයානුකූලව කටයුතු කරන බවට දැනුවත් කර ඇත. |
| **(iii)** | 09 ඡේදය | - | ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන්කර ගෙන අවම වශයෙන් මාස 04 කට වරක් හෝ සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂා කළ යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි අවස්ථා 26 කදී පරීක්ෂාවට ලක්වී කිරීම දින 171 ක සිට දින 1232 ක් දක්වා විශාල පරාසයක | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කොට්ඨාශය විශාල වීමත් ග්‍රාම නිලධාරී වසම් ගණන වැඩිවීම හේතුවෙන් ග්‍රාම නිලධාරී කාර්යාල පෞද්ගලිකව පරීක්ෂා කිරීමේ දුෂ්කරතාවයන් පවතී. |

පැවතුණි.

**(එ) වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 සමස්ථ ලංකා සිසු නිපුණතා ඇගැයීමේ වැඩ සටහනට සහභාගී වූ දරුවන්ට යෝගට් හා කිරි පැකට් ලබාදීමේදී යෝගට් 500 ක් සඳහා රු.24,975 ක සාවද්‍ය බිල් ඉදිරිපත් කර රජයේ මුදල් අවභාවිතා කළ බවට මූලික විමර්ශනයකින් තහවුරු වී තිබුණි. එයින් රු.14,000 ක් නිලධාරියෙකු විසින් 2019 මැයි 27 දින ගෙවීම්කර තිබුණද, මුදල් රෙගුලාසි 104 පරිදි පරීක්ෂණයක් පවත්වා අලාභ අයකර ගැනීමට හා වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූලව පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 පරිදි පරීක්ෂණයක් පවත්වා අලාභ අයකර ගැනීමට හා වගකිව යුත්තන්ට එරෙහිව විනයානුකූලව කටයුතු සිදුකළ යුතුය. | වගකිව යුත්තන් හඳුනාගෙන අදාළ අයකිරීම් කරන ලෙස මෙම වැඩසටහන අධීක්ෂණය කළ අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉඩම් වෙත දැනුවත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

**අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේ සිට නොපිය වූ රු.900,878 ක අග්‍රිම අත්තිකාරම් ශේෂය 2017 වර්ෂයේ නොපියවූ ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අග්‍රිම ශේෂය නොපමාව නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාරය විසින් පෙර වර්ෂවල නොපියවූ අග්‍රිම ශේෂය පවත්නා වර්ෂයේ අග්‍රිම ගිණුමට මාරු කිරීම සෑම වර්ෂයකදීම සිදුකරයි. ඒ අනුව 2012 වර්ෂයේ නොපියවූ අග්‍රිමය වර්ෂයෙන් වර්ෂයට ඉදිරියට පැමිණ 2017 වර්ෂයේ අග්‍රිම ශේෂයක් ලෙස පෙන්වා ඇත. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

**අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යය නිමකර දින 10 ක් ඇතුළත අග්‍රිමය පියවිය යුතු වුවද , රු.688,632 ක අග්‍රිම | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත | ප්‍රාදේශීය විගණන කමිටුවල සාකච්ඡා කර උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | පියවීමට දින 14 සිට දින 225 දක්වා ප්‍රමාද වූ අවස්ථා 37 ක් පැවතුණි. | මුදල් රෙගුලාසි 371 (5) චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | |
| **(ආ)** | වැඩ තහනම් කළ හා සේවය අත්හැර ගිය නිලධාරීන් සිවු දෙනෙකුගෙන් වසර 4 කට වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂය රු.224,818 ක් විය. | ලබාදුන් ණය නොපමාව අයකර ගැනීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. | වැඩ තහනමට ලක්වී හා සේවය හැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනා කොටස් වශයෙන් ගෙවීම් කරන බව දන්වා ඇත. ඉදිරියේදී නීතිපති උපදෙස් විමසා සේවයෙන් පහ කිරීමට නිර්දේශ කළ නිලධාරිනියගෙන් අය කර ගැනීමට කටයුතු කරමි. වැඩ තහනම් කළ නිලධාරියාගේ මූලික විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර අය කර ගැනීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------------ | ------------------ | -------------------------------- |
| **(අ)** | චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ අනුමත කාර්ය මණ්ඩලය හා දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්මේ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා දක්වා නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, සියලු තොරතුරු ඇතුළත්ව සකස් කර ඇත. |
| **(ආ)** | නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ඒකාබද්ධ කර ඉලක්ක පිහිටුවා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි සැලැසුම් සකස් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ද ඒකාබද්ධ කර සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | --------------- | --------------------------------- |
| (අ) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රු.399,981 ක වටිනාකමට කොන්ත්‍රාත් පවරා ඇති අඹගමුව දියසිරිගම කාණුව ඉදිකිරීමේ කොන්ත්‍රාත් වැඩ බිම 2019 ජනවාරි 24 භෞතිකව පරීක්ෂා කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් රැඳවුම් බැම්මක් ඉදිකර තිබුණද, ජලය බැසයන කාණුව ඉදිකර නොතිබුණි. තවද, ඉදිකළ රැඳවුම් බැම්ම ඉදිකළ නිවසට යාබද නිවසේ රැඳවුම් බැම්මේ පාදම පැදී එයද කඩා වැටීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | අරමුණු ඉටුවන පරිදි කර්මාන්ත ඉටු කළ යුතුය. | කොන්ත්‍රාත්කරුට දිස්ත්‍රික් ඉංජිනේරු අදාළ කාණුව සකස් කරන ලෙස උපදෙස් දුන්නද ඉදිකිරීම් නොකිරීම නිසා ඉතිරි කටයුතු කිරීම සඳහා 2019 වර්ෂයට මුදල් ඉල්ලා යවා ඇත. |
| | බැම්මේ පතුල 1.3.6 මිශ්‍රණයෙන් 1' ක් කොන්ක්‍රීට් දැමිය යුතු වුවද, කිසිදු ස්ථානයක 1' වන සේ කොන්ක්‍රීට් දමා නොතිබුණි. | භෞතිකව පවතින මිනුම් බිල්පතේ ලිවිය යුතුය. | මෙම ව්‍යාපෘතියේ බිල්පත් දෙකක පමණක් රැඳවුම් මුදල වැඩිකර ගෙවීම් කර ඇත. |
| (ආ) | වසර ගණනාවකින් අලුත්වැඩියා නොකළ රහන්වත්ත කෝවිල අලුත්වැඩියා කිරීම සඳහා රු.500,000 ක ලබාදුන් ප්‍රතිපාදනවලින් කෝවිල අවට වගාවේ ආරක්ෂාව සඳහා කෝවිල වටා වැටක් ඉදිකර තිබුණි. | ඇස්තමේන්තු සැකසීමේදි අරමුණුගතව කටයුතු කළ යුතුය. | කෝවිල් කමිටුවේ ඉල්ලීම වූයේ ඉඩම වටා වැටක් ඉදිකර දෙන ලෙසිනි. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක රු.10,660,674 ක් වූ කර්මාන්ත 09 ඉදිකිරීම් පරීක්ෂාවේදී පැවති දෝෂ පිළිබඳව විමසුම් කිරීමෙන් අනතුරුව රු.471,151 ක අධිගෙවීම් කොන්ත්‍රාත් සමිතිවලින් අයකර තිබුණද, නියමිත ප්‍රමිතියෙන් යුතුව කර්මාන්ත ඉටු නොකළ කොන්ත්‍රාත් සමිති හා නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියමිත ප්‍රමිතියෙන් යුතුව කර්මාන්ත ඉටු නොකළ කොන්ත්‍රාත් සමිති හා රාජකාරි පැහැරහැරි නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අධි ගෙවීම් අයකර රජයේ ආදායමට බැරකර ඇත. තවදුරටත් අයකළ යුතු මුදලක් වේ නම් අයකර ගනිමි. |
| (ඈ) | මාර්ගයේ සනකම 6" නොමැති | ප්‍රමිතියෙන් යුතුව කර්මාන්ත | නැවත ගණනය කර |

| | | | |
|---|---|---|---|
| | බව පෙන්වා දීමෙන් අනතුරුව කර්මාන්ත 7 ක රඳවුම් මුදලින් රු.879,559 ක් අඩුකර තිබුණද තවද අඩුපාඩු පෙන්වා දුන් මාර්ග දෙකක අධි ගෙවීම් ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. වගකිවයුතු කොන්ත්‍රාත් සමිති හා නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ඉටු නොකළ කොන්ත්‍රාත් සමිති හා නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | අධිගෙවීම් අයකර රජයේ ආදායමට බැරකර ඇත. තවදුරටත් අයකළ යුතු මුදලක් වේනම් අයකර ගනිමි. |
| (ඉ) | රු.990,000 ක වියදමින් ඉදිකළ නානුඔය උඩරදැල්ල වත්ත ග්‍රාමීය මාර්ගයේ 50' ක පමණ ප්‍රදේශයක් සම්පූර්ණයෙන්ම ඉරිතලා ගොස් තිබූ අතර, මාර්ගය මධ්‍යයේ පිපුරුම් පහරවල්ද පැවතුණි. | ඉදිකිරීම් ප්‍රමිතියෙන් යුතුව ඉටුවන බව පරීක්ෂා කළ යුතුය. | කාර්මික නිලධාරීන් ලවා පරීක්ෂා කර බලා රඳවුම් මුදලින් අඩු කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | වලපනේ විහාරස්ථානයක ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේදී කොන්ක්‍රීට් තට්ටුවේ කම්බි එළීම 6" ක පරතරයකින් සිදු කළ යුතු වුවද, 6" සිට 12" දක්වා පරතරයකින් කම්බි යොදා තිබුණි. තවද, පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව සඳහා යොදා තිබූ කම්බිද පස්වලට යටවී දිරාපත් වෙමින් පැවතුණි. | ඉදිකිරීම් නියමිත ප්‍රමිතියෙන් යුතුව ඉටුවන බවට පරීක්ෂා කළ යුතුය. | ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි මෙම මහලින් අවසන් කර වහලක් වෙනුවට මෙම කොන්ක්‍රීට් තට්ටුව මත කිසිදු බරක් නොයෙදන සේ ජලය ක්‍රමානුකූලව බැසීමට ආනත කර නිමකර නඩත්තු කිරීමට තාක්ෂණ නිලධාරී විසින් උපදෙස් ලබාදී ඇති බව දන්වමි. |
| (උ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජනේල සඳහා ආරක්ෂිත ග්‍රිල් සවිකිරීමේ කර්මාන්තයේදී ආරක්ෂිත ග්‍රිල් සඳහා වටේට 16×5mm පැතලි යකඩ (Flat iron) හා මධ්‍යයට 12×5mm පැතලි යකඩ යොදාගත යුතු වුවද, ඉහළ මහලේ මධ්‍යයට 9.5×5mm ප්‍රමාණයේ පැතලි යකඩ ද ආරක්ෂිත ග්‍රිල් සඳහා 16×5mm ප්‍රමාණයට වඩා අඩු පැතලි යකඩ භාවිතා කර තිබුණද, ඇස්තමේන්තු පරිදි ඉටුකර නොතිබූ මෙම කර්මාන්තය සඳහා රු. 845,624 ක් ගෙවීම් කර තිබුණි. | ඉදිකිරීම් ප්‍රමිතියෙන් යුතුව ඉටුවන බවට පරීක්ෂා කළ යුතුය. | අධි ගෙවීම් අයකර වාර්තා කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2018 වර්ෂයේ රු.1,000,000 ක ප්‍රතිපාදන මත ඉදිකර ඇති නෝර්වුඩ් සන්රයිස් ක්‍රිඩාංගණය මැණික් පතල් ගැරීමේ කර්මාන්තයක් සඳහා හා ආසන්නයේ පිහිටි නෝර්වුඩ් ඇළෙහි පස් ගොඩ දැමීම සඳහා භාවිතා කර ඇති බව 2019 ජනවාරි 28 දින දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | අරමුණුගතව කටයුතු කළ යුතුය. | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් එම ස්ථානයේ මැණික් ඉල්ලම් මතු කරගැනීමට පස් සේදීමට බලපත්‍රයක් ලබා දී ඇත. නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ අවසරය ඇතිව මෙම ක්‍රීඩාංගණයේ පසෙක ඉල්ලම් පස් සේදීමේ කාර්යය සිදුකෙරමින් පවතින බව හා එම ක්‍රියාවලිය හේතුවෙන් මෙම ක්‍රීඩාංගණය ක්‍රීඩා කටයුතු සඳහා යොදා ගැනීමෙන් බැහැරව ඇති බැවින් ක්‍රීඩා භූමියේ වල් බිහිවී ඇත. |
| (එ) | මහවැලි ගඟේ බාධක කපා ඉවත් කිරීමේ ව්‍යාපෘතිය ඉටුකිරීමේදී දැඩි ලෙස ඉවුර සෝදාපාලුවට ලක්වීම වැළැක්වීම සඳහා ගඟේ ගමන් මාර්ගය ගේබියන් බැම් යොදා වෙනස් කිරීමටත්, ගේබියන් බැම්වලින් පිටුපස කොටස් පස් දමා පිරවීමටත් ඇස්තමේන්තු කර තිබුණද ගේබියන් බැම් යෙදීමෙන් අනතුරුව පස් පිරවුම සිදු නොකිරීම නිසා එම ප්‍රදේශයේ ජලය රැස්වී ඩෙංගු අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | අරමුණුගතව කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික් ඉංජිනේරු, වාරිමාර්ග ඉංජිනේරු හා මහවැලි අධිකාරියේ ඉංජිනේරුගේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරමි. |
| (ඒ) | රු.1,000,000 ක ප්‍රතිපාදන මඟින් සංවර්ධනය කළ ලක්ෂපාන දෙනියහේන මාර්ගය නිසා ලක්ෂපාන දෙසට යෑමේ ගමන් මග කිලෝමීටර 30කින් පමණ කෙටි කරගත හැකි වුවද, ඒ සඳහා මාර්ගයේ පස් කැපීම ප්‍රමාණවත් පරිදි සිදුවී නොමැති වීමෙන් ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබූ බව 2019 ජනවාරි 24 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.. | අරමුණුගතව කටයුතු කළ යුතුය. | වෙන් කළ මුදල ප්‍රමාණවත් නොවූ නිසා ඉදිරි සංවර්ධන යෝජනා වලදී මෙම මාර්ගය සඳහා මුදල් වෙන් කර දෙන මෙන් අදාළ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීම් කර ඇත. |
| (ඔ) | මස්කෙළිය ග්‍රාම නිලධාරී නිල සෙවන කර්මාන්තයේ අංක 22 සඳහා ඇලුමිනියම් ජනේලවල ලූවර්ස් රේටය රු.16,822ක් වුවද, රේටය රු 18,019ක් ලෙස | අධි ගෙවීම් අය කළ යුතුය. | ඇලුමිනියම් සඳහා කළ අධි ගෙවීමට වඩා වැඩි වටිනාකමැති අමතර වැඩ ඉටුකර ඇති බව දන්වා ඇත. |

ගෙවීම් කිරීම නිසා රු.4,261 ක අධි ගෙවීමක්ද, ඇලුමිනියම් ජනේල රේටය J 060 සඳහා වන රේටය රු.13,093 ක් වුවද, එම රේටය රු.19,676 ක් ලෙස ගෙවීම නිසා රු.87,686 ක් අධි ගෙවීමක් විය.

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පැතුම්ගම හා බණ්ඩාරනායක මාවත ජල යෝජනා ක්‍රමයේ ජල මීටර් 46 ක් සියලු උපාංග සහිතව සපයා සවිකිරීමට රු.292,600 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, ජල මීටර් යෙදීමේදී මීටරයට පෙර හා පසුව යෙදිය යුතු ගේට් වැල්ව් යොදා නොතිබීම හේතුවෙන් අවශ්‍ය අවස්ථාවක ජල සමිතියට ජලය විසන්ධි කිරීමට හෝ අලුත්වැඩියා අවස්ථාවකදි නිවාස හිමියන්ට ජලය නවතා ගැනීමේ හැකියාවක් නොතිබුණි. අතර ජල මීටර් සඳහා කිසිදු වගකීම් කාලයක් ද නොතිබුණි. | අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුය. | ගේට් වැල්ව් සවි කර ව්‍යාපෘති නිසි ලෙස සම්පූර්ණ කරන ලෙසට අදාළ සමිතියට උපදෙස් දෙන ලදී. |
| (ආ) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබූ ජල ටැංකි 10 න් ටැංකි 02 ක් වලපනේ ප්‍රාදේශීය ලේකම්ගේ නිල නිවසටද, තවත් ටැංකි 02 ක් සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ නිල නිවසටද, එකක් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටද ලබා දී තිබුණි. | අරමුණුගත කාර්යයන් වෙනුවෙන් මෙම භාණ්ඩ යෙදවිය යුතුය. | නියං කාලවලදී ජලය රැස්කර තබා ගැනීමට පාසල් හා පන්සල් වෙත ජල ටැංකි ලබා දෙන ලදී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රොටෝප් දෙමළ විද්‍යාලයේ පිට්ටනියේ පස් කපා මට්ටම් කිරීම සඳහා රු.282,112 ක් ගෙවීම් කර තිබුණද, දරුවන්ට ක්‍රීඩා කළ හැකි පරිදි මට්ටම් කළ පොළවක් ක්‍රීඩා පිටිය තුළ දක්නට නොවූ බව 2019 පෙබරවාරි 21 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. | කර්මාන්තය නිසි ලෙස ඉටු කරවා ගත යුතුය. | මෙම අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස 2019 මාර්තු 22, 2019 මැයි 09 හා 2019 මැයි 21 දිනවල කොන්ත්‍රාත්කරු ලිඛිතව දැනුවත් කළද, මේ දක්වා ඉටු නොකළ නිසා රඳවුම් මුදලින් සකස් කිරීමට ඇස්තමේන්තු සකස් කර ඇත. |
| (ඈ) | කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයෑමේ අවදානමකට ලක්ව ඇති නිවාස 13 ක පදිංචිකරුවන් තාවකාලිකව රඳවා තැබීම සඳහා රු.106,163 ක් වැයකර වෙන්කර තිබූ කාමරවල ෆ්ලයිවුඩ් බෝඩ් ගලවා ඉවත් කර සාරි එල්ලා තිබූ බව, විගණිත දිනය වූ 2019 පෙබරවාරි 20 දින නිරීක්ෂණය විය. තවද, රු. 58,785 ක් ගෙවීම් කර සවිකර තිබූ දොර අඟුලුද කඩා බිඳ දමා තිබූ අතර, නියමිත ප්‍රමිතියෙන් තොරව දොරවල්ද සවිකර තිබුණි. | අරමුණු වෙනුවෙන් කර්මාන්තය භාවිතා වන බවට පසු විපරම් කළ යුතුය. | මෙම ගොඩනැගිල්ල කෙටිකාලීන භාවිතය සඳහා සංවර්ධනය කරන ලද්දක් බැවින් ඒ සඳහා රජයේ සම්මත උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය භාවිතා නොකළ බව කාර්මික නිලධාරී වාර්තා කළ අතර අවදානම් තත්ත්වය පහව ගිය පසු ප්‍රතිලාභීන් පැරණි ස්ථානවල යලි පදිංචි වී ඇත. |
| (ඉ) | ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ කැවන්ඩිෂ් වර්ගයේ කෙහෙල් පැළවල කෙහෙල් කොළ යොදා ගනිමින් පරිසර හිතකාමී ලන්ච්ෂීට් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.357,000 ක වියදමින් යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. එම යන්ත්‍රය ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල රු.1,254,220 ක වියදමින් අළුත්වැඩියා කර තිබුණද, | අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුය. | 2018 වර්ෂයේ කෙසෙල් පැළ මිල දී ගැනීමට සූදානම් වුවද, පැළ තවාන්වල පැළ නොතිබුණු බැවින් පැළ මිලදී ගැනීමට නොහැකි විය. 2019 වර්ෂයේදී පැළ මිලදී ගැනීම සඳහා මුදල් ඉල්ලීම් කර ඇත. කොට්ඨාශයේ පවතින කෙසෙල් කොළ යොදා ගෙන ලන්ච්ෂීට් නිෂ්පාදනයද ආරම්භ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැඟිල්ලේ ජනේල සඳහා ආරක්ෂිත ග්‍රිල් යොදා නොමැති බැවින්, එය යන්ත්‍රයේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව නිරීක්ෂණය විය. කැවන්ඩිෂ් වර්ගයේ කෙසෙල් පැළ 1500 ක වගාවක් 2018 දෙසැම්බර් මස ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, විගණිත දිනය වන 2019 පෙබරවාරි 14 දින වන විටත් කෙසෙල් පැළ මිලදීගෙන නොතිබුණ අතරම ලන්ච්ෂීට් නිෂ්පාදනය ආරම්භ කර ද නොතිබුණි. | | |
| (ඊ) | මස්කෙළිය ඔයේ බ්‍රාග්‍රෝ හා ග්‍රීන්ලයිම් ෆාම් කොටස්වල ඔය පළල් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිරි නඩත්තු කටයුතු සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර, අනවසරයෙන් වැලි ගොඩදැමීම වැනි අවිධිමත් ක්‍රියාවන්ට ඉඩකඩ සලසා තිබීම නිසා ඇළේ ඉවුර ඛාදනය වන බව 2018 ජූලි 06 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුය. | සංවර්ධන නිලධාරීන්ට පසු විපරම් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැවිලි සමාගම්වල ජල මූලාශ්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා රු.3,082,500 ක ප්‍රතිපාදන වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ලබාදී තිබූ අතර ව්‍යාපෘති යෝජනාවට අනුව ජල මූලාශ්‍ර පිහිටි ඉඩම් කොටස් 91 න්, ඉඩම් කට්ටි 40 ක් මැනීම | අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුය. | ජල මූලාශ්‍ර පිහිටි වතු ඉඩම් කොටස් 91 ක් පවතින බව හඳුනාගෙන ඇතත්, ප්‍රතිපාදන ලැබුණේ 2018 නොවැම්බර් මාසයේදීය. මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඔවුන්ගේ අධීක්ෂණය යටතේ දෙසැම්බර් අවසන් වන විට |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණි. එම ඉඩම් කොටස්වලද කණු සිටුවා ඒවා වෙන් කිරීමේ කාර්යය ඉටුකර නොතිබූ අතර ව්‍යාපෘති වාර්තාව නිවැරදිව සකස් නොකිරීමත්, අවශ්‍ය අවස්ථාවලදී ප්‍රසම්පාදන ඇස්තමේන්තු සකස් නොකිරීමත් ජල පෝෂක සංරක්ෂණය සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනයෙන් රු.700,000 ක මුදලක් ආපසු හරවා යැවීමත් නිසා ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබූ බව නිරීක්ෂණය විය. | | මැනිය හැකි ප්‍රමාණය ලෙස දැක්වූයේ ඉඩම් කට්ටි 40 ක් පමණක් වන අතර ප්‍රමුඛතාවය ඇති ජල මූලාශ්‍ර මැනුම් කරන ලදී. |

**3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ------------------------------- |
| (අ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිබ්බටුගොඩ ශ්‍රී සුභද්‍රාරාමයේ සංඝාවාසය තට්ටු 5 කින් යුතුව 2008 වර්ෂයේ සිට ඉදිකර තිබුණද එනම් විගණිත දින 2019 පෙබරවාරි 13 දිනය වන දක්වාම සංඝාවාසයේ එකදු කාමරයක් හෝ නාන කාමරයක් භාවිතයට ගත හැකි වන පරිදි ඉදිකර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මෙම විහාරයේ සංඝාවාසය ඉදි කිරීම සඳහා පමණක් රජයේ විවිධ වැඩසටහන් මගින් රු.6,873,981 මුදලක් වැයකර තිබුණි. | අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුය. | විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් මුදල් වෙන් වී ඇත. ලැබුණු මුදලට සරිලන ඉදිකිරීම් කර ඇත. |
| (ආ) | ආදර්ශ ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අදාළ නිළධාරීන් විසින් නිරන්තර අධීක්ෂණ කාර්යයන් සිදුකරමින් ප්‍රගති සමාලෝචන කටයුතු සිදුකළ යුතුය. ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ලබාදුන් තම්ලර් මැෂින්, කම්බි හා තහඩු තලන මැෂිම, ඩයමන්ඩ් සිදුරුපත්, හැන්ඩ්ඩ්‍රිල් වැනි උපකරණ ඵලදායී ලෙස අදාළ කාර්යයන්ට යොදා නොගෙන කර්මාන්ත අතහැර දමා තිබූ අවස්ථා 4 ක් පැවති බව 2019 පෙබරවාරි 15 සිදු කළ විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | 2017 මාර්තු 08 දිනැති අංක 2017/05 දරන සමෘද්ධි චක්‍රලේඛයෙහි 07 ඡේදය අනුව | ක්‍රියාත්මක කිරීමේදී අක්‍රිය තත්ත්වයේ පැවතිය ද මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| (ඇ) | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ රු.2,600,000 ක සහ ගම්පෙරලිය වැඩ | අරමුණු ඉටුවන පරිදි | මූලික කටයුතු පමණක් මෙම මුදලින් සිදු කර ඇති අතර, |

| | | |
|---|---|---|
| සටහනේ රු.400,000 ක ප්‍රතිපාදන මත වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විහාරස්ථාන 4ක දානශාලා, චෛත්‍ය, ආවාසගෙය ඉදිකිරීමේ මූලික කටයුතු සිදුකර තිබූ අතර, විහරස්ථානවල ඉතිරි වැඩ නිම කර ගැනීමේ ක්‍රමවේදයක් නොතිබූ බැවින්, මෙම වියදමද නිෂ්කාර්ය පිරිවැයක් වීමේ අවදානමක් පැවතුණි. | ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතුය. | ඉතිරි වැඩ කටයුතු දායක මුදල් හා ආධාර පරිත්‍යාග මුදල් මඟින් ඉටු කිරීමට විහාරාධිපති හිමිවරුන් ප්‍රකාශ කර ඇත. |

## 3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උප වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාද 2019 පෙබරවාරි 28 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු නමුත් 2019 මැයි 6 දින කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කෙරුණි. | මූල්‍ය ප්‍රකාශන සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය. | මේ වන විට කෙටුම්පත විගණනයට භාර දී ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අංශ 05 ක් මුල්කර ගනිමින් සකසා කාර්ය සාධන වාර්තාව අංශ 11 ක් ලෙස සකසා තිබුණි. | වාර්ෂික කාර්ය සාධන වාර්තාව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුරූප විය යුතු අතර, ක්‍රියාකාරී සැලැස්මෙන් හඳුනාගත් කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවෙන් දැක්විය යුතුය. | වඩාත් විස්තරාත්මකව සකසා ඇත. චක්‍රලේඛ අනුවම කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මෙන් ඉටුකළ යුතු යැයි හඳුනාගෙන තිබූ කාර්යයන් වර්ෂය තුළ නිසි ලෙස ඉටු කර නොමැති බව මෙම වාර්තාවේ අංක 1.6.3(ඖ)I,III,IV,2.1,3.2(අ),3.2.(ඒ), 3.3(ආ),3.3(ඉ) ,5.1,6(ඇ),(ඇ),(ඉ) දරන ඡේදවලින් සහ මීට අමතරව පහත විස්තර කර ඇති විගණන විමසුම් අනුවද සනාථ විය. | | |
| (i) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරීන් | - | කඩිනමින් පෞද්ගලික ලිපිගොනුවල කටයුතු |

| | | | |
|---|---|---|---|
| | 108 කගේ වැන්දඹු අනත්දරු අංක ලබාගැනීම වසර 04 කට ආසන්න කාලයක් යුතුවීම නිලධාරීන් 06 දෙනෙකුගේ සේවය ස්ථිර කිරීමට කටයුතු නොකිරීමත්, | | අවසන් කරන ලෙස උපදෙස් ලබාදී ඇත. |
| **(ii)** | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු පත්වීම් ලබා වෛද්‍ය වාර්තා නොමැතිව වසර 03 කට අධික කාලයක් සේවය කිරීම. | | |
| **(iii)** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගබඩා භාණ්ඩ නිසිලෙස හඳුනාගත හැකි ලෙස අසුරා නොතැබීම විගණිත දිනය වූ 2019 පෙබරවාරි 01 දින වන විට ගබඩා පොත් ශේෂය හා තථ්‍ය ශේෂය අතර අයිතම 41 ක වෙනසක් පැවතීම. | වර්ෂය තුළ සැලැසුම් කළ ඉලක්ක සපුරා ගැනීමට හැකිතාක් උත්සාහ දැරිය යුතුය. | ගබඩාව නව නිලධාරියෙකු වෙත පවරා විධිමත්ව පවත්වාගෙන යයි. |
| **(iv)** | නුවරඑළිය, හඟුරන්කෙත හා අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මහජන පැමිණිලි හා පෙත්සම් ලේඛන නඩත්තු නොතිබීම හා තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලීම් 04 කට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2019 මාර්තු 27 දින වන විටත් පිළිතුරු සපයා නොතිබීම. | | ලේඛන යාවත්කාලීන කර ඇත. සියලු පැමිණිලිවලට පිළිතුරු සපයා අවසන් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. |
| **(v)** | ගිණුම් අංශයේ කටයුතු සංඛ්‍යාත්මක අගයන් නොදක්වා කරුණු ලෙස කාර්යයන් පමණක් දක්වා තිබුණි. | | |
| **(vi)** | සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ වැඩ සටහනේ අක්‍රිය සාමාජිකයින් 500 දෙනෙකුගෙන් 290 දෙනෙකු පමණක් සක්‍රිය කිරීමට හැකිවීම. | | ඉතිරි ප්‍රතිලාභීන් සක්‍රිය කිරීමට කටයුතු කරමි. |
| **(vii)** | ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිවල ප්‍රගතිය අවම මට්ටමක පැවතීම. | | පිළිගනිමි. |
| **(viii)** | අඹගමුව නෝර්වුඩ් ඇළ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන පැවරුම රු.1,442,300 ක් වුවද වැය කළ මුදල රු.286,900 ක් වීමත් වැඩ අවසන් බවට කාර්ය සාධන වාර්තාවේ දක්වා තිබීම. | | පිළිගනිමි. |

| | | |
|---|---|---|
| **(ix)** | නුවරඑළිය ඩයගම ඇළ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන පැවැරුම රු.1,444,400 ක් වුවද 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය රු.318,400 ක් වීම. | පිළිගනිමි. |
| **(x)** | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය වෙනුවෙන් රු.55,529,755 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, වර්ෂ අවසානයේ මූල්‍ය ප්‍රගතිය රු.9,813,230 ක් වූ අතර, ව්‍යාපෘති 15 න් එකදු ව්‍යාපෘතියක් හෝ වර්ෂය අවසන් වන විට නිම කර නොතිබීම. | පිළිගනිමි. |
| **(xi)** | 2019 වර්ෂයට තීරණ ගැනීම සඳහා දිස්ත්‍රික් සම්පත් පැතිකඩ නිර්මාණය කිරීමට ඉලක්ක කළද එහි ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවේ දක්වා නොතිබීම. | මේ පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී. |
| **(xii)** | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවේ දක්වා නොතිබීම. | මේ පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී. |
| **(xiii)** | 2017/ 2018 වර්ෂයේ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ඉටුකළ මාර්ගයක් රු.මිලියන 13 ක වියදමින් සකස් කිරීමට ඉංජිනේරු අංශය සැලැසුම් කර තිබීම.. | 2017/2018 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ව්‍යාපෘතිය ඉටුකර ඇත. |
| **(xiv)** | අභ්‍යන්තර විගණන අංශ ඉලක්ක ලෙස හඳුනාගත් ඉලක්කයන් මෙම වාර්තාවේ අංක 3.1,3.6(අ), 3.6(ආ), 1.6.2,1.6.3(ඇ), 1.6.3(ඉ), 1.6.3(ඌ)I දරන ඡේදවල සඳහන් අඩුපාඩු නිසා වර්ෂය සපුරාගෙන නොතිබීම. | ඉලක්ක හැකිතාක් දුරට සපුරා ගැනීමට කටයුතු කර ඇත. |
| **(xv)** | ළමා හා කාන්තා කටයුතු අංශයේ ඉලක්ක පිළිබඳ නොදක්වා වර්ෂය තුළ ඉටු කළ කාර්යයන් දක්වා තිබීම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වැඩසටහන් 8 ක් කාර්ය සාධන වාර්තාවෙන් හඳුනාගත නොහැකි වීම. | කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කළ කරුණුවල නිවැරදිතාවය අදාළ අංශ මඟින් තහවුරු කර ගැනීමෙන් පසු වාර්තාව සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. |
| **(xvi)** | සංස්කෘතික හා ආගමික කටයුතු අංශයෙන් සැලැසුම් කළ කාර්යයන් 7 ක් ඉටුවූ බවට කාර්ය සාධන වාර්තාවේ දක්වා නොතිබීම හා කාර්ය සාධනය ක්‍රියාකාරී සැලැස්මට අනුරූප නොවීම. | මේ පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී. |

## 3.7 වත්කම් කළමනාකරණය

**මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විගණිත දිනය වූ 2019 පෙබරවාරි 28 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගබඩාවේ තොග ශේෂය හා භෞතික ශේෂය අතර, අයිතම 08 ක වෙනස්කම් පැවතුණි. | ගබඩා ලේඛන නිසි ලෙස නඩත්තු කළ යුතුය. | අදාළ නිවැරදි කිරීම් මේ වන විට සිදු කර ඇත. |
| (ආ) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 සහ 2017 වර්ෂවල සංවර්ධන යෝජනා යටතේ ප්‍රතිලාභීන් වෙත ලබා දීමට මිලදී ගෙන තිබූ භාණ්ඩ අයිතම 14 ක් විගණිත දිනය වන 2018 නොවැම්බර් 05 දින වනවිටත් බෙදා දීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි. | නොපමාව භාණ්ඩ බෙදා දීමට කටයුතු කළ යුතුය. | 2017 හා 2018 වර්ෂවල අදාළ සියලු භාණ්ඩ මේ වනවිට බෙදා දී ඇති අතර 2016 මිල දී ගත් ක්‍රීඩා උපකරණ හා පුටු සඳහා මන්ත්‍රීන් විසින් නම් කරන ලද සමිති වෙත ලබා දීමට කටයුතු කරයි. |
| (ඇ) | ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් 2016 වර්ෂය තුළදී ලීටර් 1000 ජල ටැංකි 40 ක් සහ 2017 වර්ෂයේදී ජල බවුසර් 02 ක් ලබාදී තිබුණද, ඒ සම්බන්ධව කිසිදු ලේඛනයක් හෝ ලිපිගොනුවක් විගණනයට ඉදිරිපත් නොකළ අතර ජල ටැංකි 09 ක් කුමන ස්ථානයක පවතීද යන්න ද තහවුරු කරගත නොහැකි විය. | වාර්තා නිසි ලෙස නඩත්තු කළ යුතුය. අස්ථානගත වූ ජල ටැංකි පිළිබඳව වගකිව යුතු නිලධාරීන් හඳුනාගත යුතුය. | ලේඛනය හා ලිපි ගොනු යාවත්කාලීන කරන ලෙස උපදෙස් දී ඇත. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක කිසිඳු ග්‍රාම නිලධාරීවරයෙකු ඉන්වෙන්ට්‍රි ලේඛනය භාවිතා කර නොතිබූ අතර, එක්සයිස් පොතක හෝ හාෆ්ෂීට් එකක ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඇතුළත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 454 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනය භාවිතා කළ යුතුය. | සියලුම ග්‍රාම නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් කරන ලදී. |
| (ඉ) | යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි පරීක්ෂාවට ලක්වූ ග්‍රාම නිලධාරී කාර්යාල 61 ක ඉන්වෙන්ට්‍රි ලේඛනය කිසිදු පරීක්ෂාවකට හෝ භාණ්ඩ සමීක්ෂණයකට ලක් කර | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සියලුම දෙපාර්තමේන්තුවල බඩු පිළිබඳ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කළ | 2019 මාර්තු 12 දින පැවති විගණන කළමනාකරණ කමිටුවේදී හා ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටුවල සාකච්ඡා කරන ලදී. ග්‍රාම නිලධාරී කාර්යාල |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි.ඉන්වෙන්ට්‍රි ලේඛනයක් නඩත්තු නොකරන කාර්යාල 11 ක් විය. | යුතුය. | මට්ටමින් ලේඛන පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇත. ග්‍රාම නිලධාරී කාර්යාල මට්ටමින් ලේඛන පවත්වා ගැනීමට හා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකිරීමට ද තීරණය කරන ලදී. |
| (ඊ) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි 3 ක් රු.1,873,635 ක වියදමින් නවීකරණය කළද කිසිදු පුහුණු කාර්යයකට යොදා නොගෙන තිබූ අතර ගොඩනැගිලිවල සිවිලිම සම්පූර්ණයෙන්ම අබලන්වී කොමඩ් හා දොර ජනෙල් කඩා දමා, විදුලි උපාංග ගලවාගෙන ගොස් අවට වල් බිහිවී බිත්ති හා වට පිල පිපිරුම් ස්ථාන ගණනාවක්ද පැවති බව 2019 පෙබරවාරි 14 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ගොඩනැඟිල්ල භාවිතයට ගත යුතුය. | මේ වන විට මෙම ගොඩනැඟිලිවල එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ දේශීය ආහාර සැකසුම් ව්‍යාපෘතිය හා ජෛව ආහාර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මූලික කටයුතු සම්පාදනය කර අවසන්ය. |
| (උ) | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාව නිශ්චිත නිලධාරියෙකු වෙත පැවරීමට කටයුතු කර නොතිබූ අතර සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීමට ලැබී තිබූ භාණ්ඩ හා අනෙකුත් භාණ්ඩ භෞතිකව ගණනය කිරීමට අපහසු වන පරිදි අක්‍රමවත්ව ගොඩ ගසා තිබීමත් භාණ්ඩ සම්බන්ධයෙන් විධිමත් වාර්තා නොවීමත් 2018 දෙසැම්බර් 07 දින සිදුකළ ගබඩා පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | ගබඩාව නිසිලෙස නඩත්තු කළ යුතු අතර ලැබූ භාණ්ඩ කාලීනව බෙදා දිය යුතුය. | නිශ්චිතව ගබඩාව නිලධාරියෙකුට භාර දී ඇත. ගබඩාව ක්‍රමවත්ව සකස් කරන ලදී . |

**3.8 පාඩු හා හානි**

**මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------- | ----------- | -------------------------------- |
| (අ) | 2018 ජූලි 11 දින නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයට සිදුවූ අනතුර පිළිබඳ 2018 ජූලි 12 දින | මුදල් රෙගුලාසි 104(3) සහ (4) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට අවසන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාරම්භක පරීක්ෂණ කමිටුව පත්කළද අදාළ වාර්තාව විගණිත දින වූ 2019 මාර්තු 27 වන විටත් කමිටු වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | 2013 ජුලි 04 දින කැබ් රථයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් 2017 ජුනි 05 දිනැති අවසන් වාර්තාව විගණන දිනය වූ 2019 පෙබරවාරි 09 දින වනවිටත් අනුමැතිය සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යවා නොතිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අඩුපාඩු සම්පූර්ණ කර නැවත ඉදිරිපත් කළ යුතු බවට දන්වා තිබුණද ඒ අනුව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 104(4) වාර්තාව සහ එම වාර්තාවට අදාළ තොරතුරු 2017 ජුනි 20 දින ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකරන ලදී. |

**3.9 කළමනාකරණ දුර්වලතා**

**මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.485,000 ක වියදමින් කඳපොල හෙදර්සෙට් වත්ත මැද කොටසට ජලය ලබාදීම සඳහා ජල ටැංකියක් ඉදිකර තිබුණද, ජල ටැංකියට වැස්මක් නොවූ බැවින්, කොළ රොඩු , දූවිලි හා අපද්‍රව්‍ය ජලයට මිශ්‍රවීමේ අවදානමක් හා ජල මූලාශ්‍රයේ ජලයේ පිරිසිදුභාවය පිළිබඳ අවදානමක් ද පැවතුණි. | ජලයේ පිරිසිදුභාවය පිළිබඳ සැලකිළිමත් විය යුතුය. | සංවර්ධන නිලධාරීන්ට අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. |
| (ආ) | වැඩිපුර ගෙවන ලද රු.1,848,536 ක ජීවන වියදමෙන් රු.1,164,638 ක් විශ්‍රාම වැටුපෙන් අයකර තිබුණද, මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිලධාරීන් තම රාජකාරිය නිසි ලෙස ඉටු කළ යුතුය. | හමුදා විශ්‍රාම වැටුප් දෙකක් ගෙවන නිලධාරීන්ගේ ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවීම් වේ. වැටුප හා විශ්‍රාම වැටුප් ආයතන දෙකකින් සිදු වීම මත සිදු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2014 ඔක්තෝබර් 27 දින ලබාදී තිබූ රු.4,081,987 ක මුදල් අනුමැතියකින් තොරව ප්‍රජාමූල බැංකු 05 ක 2019 මාර්තු 21 දින වන විටත් තැන්පත් කර තිබුණි. | නොපමාව මෙම මුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | මූලස්ථාන කළමනාකරුට අවශ්‍ය කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. |
| (ඈ) | පෝෂණ දීමනාවට අදාළව අඩුපාඩු සහිත අයදුම්පත් එම ගර්භණී මව්වරුන්ට ලබා දී අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු නොකර ගොනු ගත කර තිබීම නිසා ගර්භණී මවුවරුන් 11 කට රු.20,000 ක ප්‍රතිලාභ අහිමි වී තිබුණි. | නිලධාරීන් තම වගකීම් නිසි ලෙස ඉටු කළ යුතුය. | නව විෂය නිලධාරියෙකු පත්කර අඩුපාඩු ඇති නොවන පරිදි කටයුතු කරමි. |
| (ඉ) | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුමත වූ සිප්දොර ශිෂ්‍යත්ව 80 න් ශිෂ්‍යත්වලාභීන් 42 තෝරාගෙන, තිබූ අතර නියමිත දිනට කාර්ය ඉටු නොකිරීම නිසා ඉතිරි ශිෂ්‍යත්ව 38 වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් වෙත ලබාදී තිබුණි. | නිලධාරීන් තම රාජකාරිය නිසි ලෙස ඉටු කළ යුතුය. | නියමිත දිනට කාර්යය ඉටු නොකළ නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා ඇත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ ඉලක්ක 2018 දෙසැම්බර් 31 දින වන විටද සකස් කර නොතිබූ අතර අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබීමත් හඳුනාගෙන ඇති අරමුණු ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට | නොපමාව ඉලක්ක පිහිටුවා ගත යුතුය. | පිළිතුරු ලබා දී නැත. |

ඇතුළත් කර ද නොතිබුණි.

5. **යහපාලනය**

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තොරතුරු දැනගැනීමේ පනත යටතේ 2018 වර්ෂය තුළ අවස්ථා 04 කදී ඉල්ලීම් කරන ලද තොරතුරු 2019 මාර්තු 27 විගණිත දිනය වන විටත් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාදී නොතිබුණි. | නොපමාව කටයුතු අවසන් කළ යුතුය. | තොරතුරු දැනගැනීමේ පනත අනුව අදාල කාලය තුළ තොරතුරු ලබාදෙන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත. |

6. **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් සඳහා අනුමත කාර්මික නිලධාරී තනතුරු 11 න් තනතුරු 10 ක් පුරප්පාඩු වී තිබූ අතර අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 566 න් 160 ක පුරප්පාඩු ද, සහකාර අධ්‍යක්ෂ තනතුරු 10 න් තනතුරු 03ක පුරප්පාඩු ද පැවතුණි. | පුරප්පාඩු නොපමාව පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් සඳහා භාෂා පරිවර්තක අනුමත තනතුරු 07 න් 05 ක් පුරප්පාඩු වී පැවතුණි. | පුරප්පාඩු නොපමාව පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | 2014 හා 2015 වර්ෂවල පත්වීම් ලද නිලධාරීන් දෙදෙනෙකුම වෛද්‍ය | නොපමාව වෛද්‍ය වාර්තා ලබාගත යුතුය. | කඩිනමින් එම නිලධාරීන් වෛද්‍ය පරීක්ෂණයට යොමු කර වෛද්‍ය වාර්තා ලබා ගෙන |

| | | | |
|---|---|---|---|
| | වාර්තා ලබාදී නොතිබූ බව 2018 ඔක්තෝබර් මස 23 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | | පෞද්ගලික ලිපි ගොනු වෙත දැමීමට කටයුතු කරයි. |
| **(ඇ)** | 2013 සහ 2017 වර්ෂවල පත්වීම් ලද හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිළධාරීන් 128 දෙනාගෙන් 118 දෙනෙකු වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කර නොතිබුණි. | නොපමාව ලියාපදිංචි කිරීමේ කටයුතු නිමකළ යුතුය. | වැන්දඹු /අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට නව ලියාපදිංචිය යටතේ 20 දෙනකු ඇතුළත් කර ඇති අතර කඩිනමින් ඉතිරි සංවර්ධන නිලධාරීන් ලියාපදිංචිය සිදු කරයි. |
| **(ඉ)** | පරිවාස කාලය අවසන් කර සේවයේ ස්ථිර කිරීමට සුදුසුකම් සපුරා ඇති හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් 06 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමේ ප්‍රමාදයක් පැවතුණි. | පෞද්ගලික ලිපිගොනු නිසි ලෙස නඩත්තු කළ යුතුය. | කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |